# ජපානයේ රැකියා සිහිනය සැබෑ කර ගැනීමට ඔබට අනගි අවස්ථාවක්

**ඉදිකිරීම් ක්ෂේත්‍රය (construction) – (පිරිමි)**
**සාත්තුසේවා ක්ෂේත්‍රය (caregiving) (කාන්තා)**

IM Japan තාක්ෂණික සේවාස්ථ පුහුණු වැඩසටහන (TITP) යටතේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ - පිරිමි (Construction - Male) සහ සාත්තු සේවා ක්ෂේත්‍රයේ - කාන්තා (Care giving -Female) රැකියා සඳහා අයදුම්කරුවන් දැනුවත් කිරීමේ හා බඳවාගැනීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දී පැවැත්වේ.

ඒ සඳහා පහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අදාල සහතිකපත් හා ලිපිලේඛන ද සහිතව 2026.02.10 දින පෙ.ව.9.00 ට අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල ලිපිනයේ පිහිටි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ ප්‍රධාන කාර්යාලයේ ශ්‍රවණාගාරය වෙත පැමිණෙන්න.

**(සැ.යු.මින් පෙර ජපානය සඳහා වීසා අයදුම්කර ප්‍රතික්ෂේප වී ඇති අයදුම්කරුවන් මේ සඳහා අයදුම් කිරීමෙන් වලකින්න)**

**ඉදිකිරීම් අංශය සඳහා අවශ්‍ය මූලික සුදුසුකම්.**

- වයස අවු.18-30 අතර විය යුතුය.
- ජපන් භාෂා ප්‍රවීනතා විභාග JLPT, NAT විභාග වලින් N5 මට්ටම හෝ JFT විභාගය සමත් වීම හෝ එකී විභාගකට පෙනී සිට තිබීම.
- ශරීරයේ Tattoos නොතිබිය යුතුය.
- අ.පො.ස (උ.පෙළ) විභාගය සඳහා පෙනී සිට තිබිය යුතුය. (රජයේ පාසලක හෝ පෞද්ගලික පාසලක වසර 13 ක කාලයක් අධ්‍යාපනය සම්පූර්ණ කර තිබිය යුතුය.)
- උස 160 cm හෝ ඊට වැඩිවිය යුතුය.
- බර 50 Kg හෝ ඊට වැඩිවිය යුතුය.
- දෘෂ්ඨි ආබාධ නොතිබිය යුතුය. (ජපන් දෘෂ්ඨි අගය 0.7 ට වඩා වැඩි හා ශ්‍රී ලංකා දෘෂ්ඨි අගය 6/9 වඩා වැඩි)

**සාත්තුසේවා අංශය සඳහා අවශ්‍ය මූලික සුදුසුකම්.**

- වයස අවු.18-30 අතර විය යුතුය.
- ජපන් භාෂා ප්‍රවීණතා විභාග JLPT , NAT විභාග වලින් N4 මට්ටම හෝ JFT විභාගය සමත් වීම හෝ ඊට ඉහළ සුදුසුකම් තිබිය යුතුය.
- ශරීරයේ Tattoos නොතිබිය යුතුය.
- අ.පො.ස (උ.පෙළ) විභාගය සඳහා පෙනී සිට තිබිය යුතුය. (රජයේ පාසලක හෝ පෞද්ගලික පාසලක වසර 13 ක කාලයක් අධ්‍යාපනය සම්පූර්ණ කර තිබිය යුතුය.)
- උස 150 cm හෝ ඊට වැඩිවිය යුතුය.
- බර 40 Kg හෝ ඊට වැඩිවිය යුතුය.
- දෘෂ්ඨි ආබාධ නොතිබිය යුතුය. (ජපන් දෘෂ්ඨි අගය 0.7 ට වඩා වැඩි හා ශ්‍රී ලංකා දෘෂ්ඨි අගය 6/9 වඩා වැඩි)

**අවශ්‍ය ලිපිලේඛන.**

- සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (අයදුම්පත්‍රය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ www.slbfe.lk වෙබ් අඩවියේ පලකර ඇත.)
- පාසැල් හැරයාමේ සහතිකය
- අ.පො.ස (උ.පෙළ) ප්‍රතිඵල සහතිකය
- ජාතික හැඳුනුම්පත
- NAT, JLPT හෝ JFT සහතිකය / ප්‍රතිඵල ලේඛනය

**වැඩි විස්තර සඳහා 011-2777093 / 1989 අමතන්න**

**(බඳවාගැනීම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් පමණි.)**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය